WORKED.


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,416 — 1958 ජූලි 7 වැනි සඳුද — 7.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඹ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**අංක ඇෆ්.සී/වී.ඇස්.ඇෆ් 7(1) දරණ මිළ නියෝගය.** **හරක් මස්**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් සතරසිංහගේ දෙන් සුගතදාස වන මම 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි ඡෙදය හා 3(2) වැනි ඡෙදයෙන්ද මා කෙරෙහි පවරා ඇති බලතල අනුව—

(1) මීට යාකර ඇති උපලේඛනයේ 2,3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් මිල, මෙරට හරක් මස් රාත්තලක වැඩිම මිල වශයෙන් වහාම ක්‍රියාත්මක වනසේ නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් මෙරට හරක් මස්, එම උපලේඛනයේම 1 වෙනි තීරයෙහි සඳහන් කොට ඇති ප්‍රදේශය තුළ එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(2) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) " මෙරට හරක් මස් " යනුවෙන් හැඟවෙන්නේ ඇති කරන ඉන්දියානු හෝ සිංහල ගවයන්ගේ හෝ මීහරකුන්ගේ මාංශයයි. බොකු, බඩවැල් ආදී සියළු ආකාර ඉවත් කරණු ලබන දය මීට ඇතුළත් නොවේ.

(ආ) සතෙකුගේ සිරුර විකිණීම සඳහා මස් මඩුවේ පිළියෙලකොට ඇති පරිදි (එනම් හිස, හම, බොකු බඩවැල්, කුර සහ වෙනත් සියළු විධියේ සාමාන්‍යයෙන් ඉවත් කරණු ලබන දය අතහැර) විකුණන විට " තනිබර අනුව " විකිණීමක් ලෙස සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) කටු සහිත මෙරට හරක් මස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට 25 කට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(4) කොළඹ දිස්ත්‍රික්කයේ (කොළඹ නාගරික සීමාව හැර) කිසියම් තැනක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උප ලේඛනයෙහි සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් මෙරට හරක් මස් ඇති සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් එකී ස්ථානයේ, පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(5) " මෙරට හරක් මස් " විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා එළිදරව්වේ තැබිය යුත්තේ ඒ සඳහා වෙන්කොට ඇති වෙළඳ පිල්වල පමණකි. එම වෙළඳ පිල්වල වෙනත් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා එළිදරව්වේ තැබීම නොකළ යුතුයි.

(6) කොළඹ දිස්ත්‍රික්කයේ (කොළඹ නාගරික සීමාව හැර) කිසියම් තැනක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උපලේඛනයෙහි සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් " මෙරට හරක් මස් " ඇති සෑම වෙළෙන්දෙකුම එම වර්ගයට සහ ශ්‍රෙණියට අයත් මෙරට හරක් මස් පමණක් විකුණන බවට එම මස් විකුණන වෙළඳ පිලෙහි පැහැදිලිව පෙනෙනසේ දැන්වීමක් තැබිය යුතුයි.

(7) ඉවත් කරණු ලබන දය සමග මෙරට හරක් මස් එකම ගණුදෙනුවකදී විකුණනු ලබන විට මෙරට හරක් මස් ඉවත් කරණු ලබන දයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(8) සෑම වෙළෙන්දෙකුම මෙරට හරක් මස් විකුණන කල්හි, මෙරට හරක් මස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකිවනසේ බර කිරණ තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(9) මීට යාකර ඇති උප ලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් මෙරට හරක්මස් විකුණන සෑම වෙළෙන්දෙකුම, මෙරට හරක් මස් ලබාගන්නෙකු ඉල්ලා සිටිය විට කුයිතාන්සියක් දිය යුතුයි. එම කුයිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ මෙරට හරක් මස් ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ මෙරට හරක් මස්වල විස්තරය ; සහ

(ඈ) විකුණූ මෙරට හරක් මස් ප්‍රමාණයට ගෙවූ මුදල ද, සඳහන් විය යුතුයි.


1795—ජේ. ඇන්. ආර 24970—4,385 (7/58)

(10) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනලද සෑම ප්‍රදේශයක් තුළ, කිසිවෙකු උපලේඛනයේ සඳහන් දය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කලවම් කොට නොවිකිණිය යුතුයි.

(11) උපලේඛනයෙහි සඳහන් දය විකුණන කල්හි, එකී දය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිලක් වෙතොත් එය එම උපලේඛනයෙහි 2, 3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(12) මෙම නියෝගයෙහි කාර්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා." යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1958 ජුලි 7 වෙනි දින පස්වරු 2.30ට කොළඹ කච්චේරියේදී අත්සන් කරණලදී.

ඇස්. ඩී. සුගතදස,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

### මෙරට හරක් මස් සඳහා වැඩිම මිල

| 1 වෙනි තීරය ප්‍රදේශය | දෙවෙනි තීරය මෙරට හරක් මස් කටු රහිත රාත්තලක වැඩිම මිළ | 3 වෙනි තීරය මෙරට හරක් මස් කටු සහිත රාත්තලක වැඩිම මිළ | 4 වෙනි තීරය මෙරට හරක් මස් තනි බර අනුව රාත්තලක වැඩිම මිළ |
|---|---|---|---|
| | රු. ශ | රු. ශ. | රු. ශ. |
| කොළඹ දිස්ත්‍රික්කය හැර කොළඹ නාගරික සීමාව හැර ... ... ... | 0 80 ... | 0 65 ... | 0 55 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිසි.